ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය ස්ථායිතා අධ්‍යයන දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 ජුනි 23 වැනි දින |

## මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම - 2013

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ලෙස, මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ. මූල්‍ය අංශයේ වර්ධනයන්, මූල්‍ය පද්ධති ස්ථායිතාවයට බලපෑ හැකි අවදානම් අවම කිරීමට ගෙන ඇති ප්‍රතිපත්තිමය පියවර සහ දේශීය මෙන්ම ගෝලීය ආර්ථිකයේ නැගී එන ප්‍රවණතාවන්ගෙන් මූල්‍ය පද්ධති ස්ථායිතාවයට විය හැකි බලපෑම් වැනි ක්ෂේත්‍රයන් මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම මගින් ආවරණය කරනු ලබයි. මීට අමතරව, මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම මගින් ගැඹුරින් විමර්ශනය කරනු ලැබූ කාලීන අධ්‍යයනයන් කිහිපයක් ද ඉදිරිපත් කරයි.

2013 මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම මගින් අවධාරණය කරන පරිදි, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය ශක්තිමත්ව පැවැතෙමින් දේශීය ආර්ථික කටයුතුවල ප්‍රසාරණයට අඛණ්ඩව දායක විය. බැංකු සහ මූල්‍ය සමාගම් අංශ ඒවායේ අඛණ්ඩතාවය යහපත් මට්ටමක පවත්වාගනු ලැබිණි. රක්ෂණ ක්ෂේත්‍රය ද, එහි නුබුන්වත් බව සහ ද්‍රවශීලතාව හිතකර මට්ටම්වල පවත්වා ගන්නා ලදී. මේ අතර, මූල්‍ය වෙළෙඳපොළවල් ද්‍රවශීලව පැවැතුණි. 2013 වසරේ දී සහ 2014 වසරේ මුල් භාගයේ දී සිදු වූ මූල්‍ය ප්‍රතිපත්තියේ ලිහිල්වීමට පසුගාමීව සිදු වූ පොලී අනුපාත අඛණ්ඩව පහත හෙළීම, ඉදිරියේ දී ණය වර්ධනය උත්තේජනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පැමිණීම, 2014 වසරේ දී ඉහළ යනු ඇතැයි අපේක්ෂිත දේශීය ආර්ථික ක්‍රියාකාරිත්වයට තවදුරටත් උත්තේජකයක් වනු ඇත.

දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ අරමුණින් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රතිපත්තිමය මූලෝපායයන් හේතුවෙන්, 2013 වසර තුළ දී ණයකර සම්බන්ධයෙන් පැවැති ක්‍රියාකාරිත්වය ඉහළ යන ලදී. සාංගමික බැඳුම්කර වෙළෙඳපොළේ සංවර්ධනයන්, දේශීය ආර්ථිකයේ ශක්තිමත් බව තර කරනු ඇත. රටෙහි ගෙවීම් සහ පියවීම් පද්ධති සම්බන්ධයෙන් ගත්කළ, පොදු ගෙවීම් කාඩ්පත් සහ ගෙවීම් ස්විචයේ (CCAPS) පළමු අදියර වන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් 2013 ජූලි මාසයේ දී ආරම්භ කරන ලදී. පොදු ගෙවීම් කාඩ්පත් සහ ගෙවීම් පද්ධතිය මගින්, ඉලෙක්ට්‍රොනික සිල්ලර ගෙවීම් පද්ධති සඳහා සමස්ත රටම ආවරණය කෙරෙන පරිදි පොදු වේදිකාවක් නිර්මාණය කෙරෙන අතර, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව පරිහරණය කෙරෙනු ඇත. එමගින් මූල්‍ය ආයතන විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම් සැපයීමේ දී වන පිරිවැය අවම කිරීමට ද හැකිවනු ඇත. විද්‍යුත් මුදල්, විද්‍යුත් ගෙවීම් සහ ජංගම ගෙවීම් පද්ධතීන්හි සිල්ලර ගනුදෙනු පුළුල් පරාසයක පවත්වාගෙන යා හැකි වන පරිදි, රටෙහි ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම් තවදුරටත් තාක්ෂණිකමය ගනුදෙනු පරාසයක් තුළ සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මේ අතරතුර, මූල්‍ය අංශයේ ඒකාබද්ධීකරණය කිරීම තුළින්, වඩාත් පුළුල් පරාසයක මූල්‍ය සේවාවන් පවත්වාගෙන යා හැකි වන පරිදි, ශක්තිමත් සහ වඩාත් කාර්යක්ෂමශීලී මූල්‍ය ආයතනයන් බිහි කෙරෙනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ආයතනයන්හි රෙගුලාසි මෙන්ම සිය සුපරීක්ෂාවට යටත් ගෙවීම් සහ පියවීම් පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත. ශක්තිමත් නියාමනයත්, ඉදිරි අවදානම් සහ අනතුරු තත්ත්වයන් හඳුනාගැනීම කේන්ද්‍රගතකොට ගත් අධීක්ෂණයත් හේතුවෙන් එල්ලවිය හැකි කම්පනයන් හමුවේ දේශීය මූල්‍ය පද්ධතිය නොබිඳී පවත්වා ගැනීමටත්, ආතතීය අවස්ථාවන්හිදී සහ ව්‍යුහාත්මක ගැලපීම්වල දී පවා ණය දීම්, රක්ෂණ සේවාවන් සහ ගෙවීම් සම්පාදනය කිරීම් වැනි මූල්‍ය සේවාවන් අඛණ්ඩව සැපයීමටත් හැකිවනු ඇත.

2013 මූල්‍ය පද්ධති ස්ථායීතා විමසුම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියට පිවිසෙන්න:www.cbsl.gov.lk